ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019 පෙබරවාරි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 ජනවාරි

**නිෂ්පාදන ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වීම** සඳහා 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2019 ජනවාරි මාසයේදී, නිමි ඇඳුම් නිෂ්පාදන අංශයේ, රැකියා නියුක්තියෙහි සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු වර්ධනය හේතු විය. පැවති රැකියා පුරප්පාඩු පිරවීම සඳහා සිදු කරන ලද නව බඳවාගැනීම් හේතුවෙන් රැකියා නියුක්තියෙහි මෙම සැළකිය යුතු වර්ධනය දක්නට ලැබුණි. රැකියා නියුක්තියෙහි වර්ධනය මෙන්ම පෙර මාසයෙන් ඉදිරියට ගෙනා ඇණවුම් හේතුවෙන් නිෂ්පාදනයෙහි වැඩි වීමක් ඇති විය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**


**54.4**

**2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.7 ක වැඩිවීමකි.**

| විචලයය | 2018 දෙසැ. | 2019 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **53.7** | **54.4** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 57.0 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 51.5 | 55.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.5 | 52.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 60.5 | 55.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 55.5 | 55.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වුවත්, උත්සව සමය අවසන් වීමත් සමග නව ඇණවුම් අඩු වීමක් සිදු විය. නව ඇණවුම් වල ඇතිවූ මන්දගාමී වර්ධනය සහ පෙර මාසයෙන් ඉදිරියට ගෙනා අමුද්‍රව්‍ය තොග පැවතීම හේතුවෙන්, තොග මිලදී ගැනීම් වල අඩු වීමක් සිදු විය. ජනවාරි මස අග භාගයේදී ඇතිවූ සැපයුම් ගෙන්වා ගැනීමේ ගැටළු නිසා, සැපයුම්කරුවන්ගේ සැපයුම් කාලයෙහි සුළු වැඩි වීමක් සිදු විය.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කළ අතර, 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.8 කින් පහළ යමින් 2019 ජනවාරි මාසයේදී 50.7 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 ජනවාරි මාසයේදී, යුරෝපා කලාපය , එක්සත් රාජධානිය, චීනය, සිංගප්පූරුව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කළ අතර ජනපදය සහ ඉන්දියාව වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 පෙබරවාරි 14 වන දිනට)*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමගින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**2019 ජනවාරි මාසයේ දී සේවා අංශය ඉහළ වේගයකින් වර්ධනය** වූ අතර සේවා නියුක්තිය, නව ව්‍යාපාර සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ සැලකිය යුතු ඉහළ යෑම ඊට හේතු විය.

2018 දෙසැම්බර් මාසයේ දී බඳවා ගැනීම් ප්‍රමාද වූ පුරප්පාඩු පිරවීම සඳහා 2019 ජනවාරි මාසයේ දී නව බඳවා ගැනීම් සිදු කිරීම හේතුවෙන් සේවා නියුක්ති උප දර්ශකයේ මාස හතකින් වාර්තා වූ ඉහළම අගය ජනවාරි මාසයේ දී වාර්තා විය. නව කණ්ඩායම් බඳවා ගැනීම සහ නව වසර වෙනුවෙන් ත්‍යාග බාර දීම් ඉහළ යෑම හේතුවෙන් පිළිවෙලින් අධ්‍යාපන සහ තැපැල් සහ කුරියර් සේවා උප කාණ්ඩයන්හි ප්‍රතිචාර දක්වන්නන් විසින් 2019 ජනවාරි මාසයේ දී ඔවුන්ගේ නව ව්‍යාපාර වර්ධනය වූ බව සඳහන් කර තිබුණි. නව අයවැය මගින් දේශීය ආර්ථිකයට කිසියම් උත්තේජනයක් ලබා දෙතැයි සේවා සපයන්නන් අපේක්ෂා කිරීම හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් ද වර්ධනය විය.

| විචල්‍යය | 2018 දෙසැ. | 2019 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.7** | **55.8** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 55.4 | 57.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 64.5 | 56.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.1 | 57.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.2 | 42.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.4 | 64.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ වුවද, වසර ආරම්භයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලද්දේ, 2019 ජනවාරි මාසයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මට්ටම, උත්සව සමය සහ සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන කාලය වන 2018 දෙසැම්බර් මාසයේ පැවති ඉහළ ක්‍රියාකාරී මට්ටම සමඟ සැසඳීම හේතුවෙන් විය හැකිය.


රුපියලෙහි අගය ස්ථාවර වීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් 2019 ජනවාරි මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලද අතර වාර්ෂික වැටුප් වර්ධක අප්‍රේල් මාසයට නියමිතව තිබීම හේතුවෙන් සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය වැඩි වේගයකින් ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.8**

**2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.1 ක වැඩි වීමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි තවදුරටත් අඩු වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2018 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ 53.0 හි සිට 2019 ජනවාරි මාසයේ දී මාස 28 කින් වාර්තා වූ පහළම අගය වන 52.6 දක්වා පහළ යන ලදී. කෙසේ වුවද, එය පසුගිය මාස 114 තුළ ගෝලීය සේවා නිමැවුමෙහි වර්ධනයක් පෙන්නුම් කරයි.

ජපානය, චීනය, එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2018 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2019 ජනවාරි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

*(මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 පෙබරවාරි 14 වන දිනට)*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.